නීතිඥ සේනක පෙරේරා
සභාපති,
සිරකරු අයිතිවාසිකම් සුරකීමේ කමිටුව,
අංක 170,හල්ස්ඩ්‍රොප් වීදිය, කොළඹ 12
0714453890 / perera.senaka@gmail.com

සභාපතිනිය,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව,
අංක 14,
ආර්.ඒ. ද මෙල් මාවත,
කොළඹ 04.

**සිරකරුවන්ට පහර දීම සම්බන්ධයෙන් සමාජ මාද්‍යයෙහි පළවූ වීඩියෝවක් සම්බන්ධයෙන් ඉදිරිපත් කරන පැමිණිල්ලයි.**

2022 මැයි මස 09 වන දින හෝ ආසන්න දිනයකදී සමාජ මාධ්‍යයෙහි පළවූ විඩීයෝ දර්ශන නැරඹීමේ දී මා දුටුවේ අපි සිරකරුවෝ යැයි පවසන තැනැත්තෙකුට වධහිංසා සහ හෝ අවමන් සහගත සැලකීම් වලට ලක් කරන අවස්තාවකි. එමෙන් ම එම දර්ශන වල සිටින්නේ බන්ධනාගාර සිරකරුවන් බවත්, ඔවුන් පුනරුත්ථාපනය සදහා යොදවා ඇති සිරකරුවන් බවත් පෙනී යයි. තවදුරටත් එකී වීඩියෝ දර්ශන නැරඹීමේදී පෙනී යන්නේ එකී පිරිස වටරැක බන්ධානාගාරයේ සිට බස් රථයකින් යම් කටයුත්තකට රැගෙන යාමේ දී මෙම වධ හිංසාවට ලක්වී ඇති බවයි. එසේම මොවුන්ගේ ප්‍රකාශවලට අනුව වටරැක බන්ධනාගාරයේ රාමනායක නැමැති ජේලර්වරයා ඔවුන් සමග සිටින බව පෙනී යයි.
බන්ධනාගාර සිර කරුවන් මෙසේ අනාරක්ෂිතව සහ වගකීම්විරහිතව රැගෙන යාම බන්ධනාගාර අඥපනතේ ප්‍රතිපාදන මෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්තාවේ සදහන් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කරන්නකි. එසේම එය සිරකරුවන්ට සැලකීම පිළිබද අවම ප්‍රමිතීන් ඇතුළත් ප්‍රඥප්තියට එරෙහිව යාමක් ද වේ.
එබැවින් මෙම සමාජ මාධ්‍ය දර්ශන වල ඇතුළත් සිදුවීම සම්බන්ධයෙන් ඉක්මන් සහ විධිමත් පරීක්ෂණයක් සිදු කර වධහිංසාවට ලක්වූ සිරකරුවන්ට සාධාරණයක් ඉටු කිරීමටත් මෙවැනි සිදුවීම් යලිත් සිදු නොවීමට අවශ්‍ය මාර්ගෝපදේශයන් ලබා දෙන ලෙසත් වගකිව යුත්තන් සම්බන්ධයෙන් සුදුසු පියවර ගන්නා ලෙසත් අප සංවිධානය ඉතා වගකීමෙන් ඉල්ලා සිටිමු.

තවද ඉහත සදහන් කල සමාජ මාධ්‍යයෙහි පළවූ දර්ශන ඇතුලත් සබැදියාව (Link) පහත දක්වා ඇත.

**https://www.facebook.com/kshenalDB/posts/5093474784052258**

ස්තුතියි,
මෙයට

Senaka

නීතිඥ සේනක පෙරේරා
2022.06.07